# කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
## முகாமைத்துவக் கணக்காய்வுத் திணைக்களம்
## DEPARTMENT OF MANAGEMENT AUDIT

මුදල් අමාත්‍යාංශය | நிதி அமைச்சு | MINISTRY OF FINANCE
මහලේකම් කාර්යාලය, කොළඹ 01 | செயலகம், கொழும்பு 01 | The Secretariat, Colombo 01

මගේ අංකය / எனது இல / My No: DMA/AMC/M/2020/5-4
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2020.09.04

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත,

<u>අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලදී සාකච්ඡාවට භාජනය කළයුතු කරුණු</u>

අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් එම අමාත්‍යාංශය, ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතනවල ප්‍රධානීන්ගේ සහභාගිත්වයෙන් පැවැත්විය යුතු බවට DMA/01-2019 චක්‍රලේඛය මගින් පෙන්වා දී ඇති අතර , ඒ අනුව සියලුම අමාත්‍යාංශවල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නිසි පරිදි පවත්වන බවත්, එමගින් ඵලදායි ප්‍රතිඵල සෑම අමාත්‍යාංශයක්ම අත්කරගෙන ඇති බවත් නිරීක්ෂණය වේ. තවද අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාව තවදුරටත් ඉහළ නංවා ගැනීම සඳහා පහත කරුණු පිළිබඳව ඔබගේ අවධානය යොමු කිරීමට කැමැත්තෙමි.

2. අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීමට ප්‍රථම අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ඊට අනුබද්ධ සියලුම ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා ඒවායෙහි පවතින කරුණු නිසි පරිදි සාකච්ඡා කර ඒවාට අදාල තීරණ හා ක්‍රියාමාර්ග ගැනීමෙන් පසුව අමාත්‍යාංශයේ කමිටුව වෙත ඉදිරිපත් කල යුතු කරුණු තිබේ නම් පමණක් එහි දී සාකච්ඡා කර තීරණ ගැනීම සඳහා ඉදිරිපත් කිරීමට උපදෙස් දෙන්නේ නම් මැනවි.

3. එසේ ක්‍රියාකිරීම මගින් අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටුවේ සාකච්ඡාවට භාජනය කළයුතු කරුණු ප්‍රමාණය සීමා කරගත හැකි බැවින් අමාත්‍යාංශයට අදාල කරුණු සඳහා මෙන්ම දෙපාර්තමේන්තු හා ආයතන වලින් ඉදිරිපත් කරන විශේෂිත කරුණු කෙරෙහි වැඩි අවධානයක් යොමු කර එම ගැටළු සඳහා නිසි විසඳුම් හා ක්‍රියාමාර්ග ගැනීමට වැඩි ඉඩ කඩක් ලැබෙනු ඇත.

4. එමෙන්ම අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපති හා සාමාජිකයින්ට කමිටුවක් ලෙස කටයුතු කිරීමට හැකිවන පරිදි අදාල රැස්වීම සංවිධානය කර ගැනීමත් කර ගත යුතු වේ.

5. මෙම පියවරයන් අනුගමනය කිරීමෙන් අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ කාර්යක්ෂමතාවය මෙන්ම ඵලදායිතාවය ද තවදුරටත් වර්ධනය කරගත හැකි බැවින් එසේ කටයුතු කරන ලෙස ඔබගේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා වෙත හා ඔබ යටතේ පවතින දෙපාර්තමේන්තු හා ආයතන වල ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්, අභ්‍යන්තර විගණකවරුන් වෙත උපදෙස් ලබාදෙන ලෙස ද කාරුණිකව ඉල්ලා සිටිමි.

එස්.ඒ. චන්ද්‍රිකා කුලතිලක
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත - ප්‍රධාන අභ්‍යන්තර විගණක/අභ්‍යන්තර විගණක - කාරු, ඉහත පරිදි කටයුතු කිරීම සඳහා

කාර්යාලය / அலுவலகம் / Office: 2484816, 2484500, 2484600
අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General: 2484543
ෆැක්ස් / பெக்ஸ் / Fax: 2449496
වෙබ් අඩවිය / வெப் சைட் / website: www.treasury.gov.lk